# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2322/43 - 2023 මාර්තු මස 08 වැනි බදාදා - 2023.03.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

**ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 අධිකාරය)**

38(3) උපවගන්තිය යටතේ වූ නියමය

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (සංශෝධිත) 38(1)(ඇ) වගන්තිය යටතේ මා විසින් පළ කරන ලද අංක 2317/17 හා 2023.01.30 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් කළ පරිදි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් පළාත් පාලන ආයතන සඳහා වූ ඡන්ද විමසීම 2023 මාර්තු මස 09 දින නොපැවැත්වෙන බව ද,

මැතිවරණ කොමිෂන් සභාවේ පාලනයෙන් පරිබාහිර අනපේක්ෂිත හා නොවැළැක්විය හැකි කරුණු හේතු කොටගෙන එකී ඡන්ද විමසීමේ දිනය කල් දැමීමට සිදු වී ඇති බැව් මැතිවරණ කොමිෂන් සභාව විමසීමෙන් අනතුරුව එකී කොමිෂන් සභාව විසින් මා හට උපදෙස් දී ඇති හෙයින් ද,

එකී පළාත් පාලන ආයතනවලට අදාළ නව ඡන්ද විමසීමේ දිනය වශයෙන් 2023 අප්‍රේල් මස 25 වැනි දිනය මවිසින් මෙයින් නියම කරන බව ද,

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (සංශෝධිත) 38(1)(ඇ) උප වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 38(3) උප වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ජේ.එම්.ඒ.ඩග්ලස්,**
තේරීම්භාර නිලධාරි,
අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය.

2023 මාර්තු මස 08 වැනි දින,
අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

1A - G 39061 — 31 (2023/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

අක්කරෙයිපත්තු මහා නගර සභාව

අම්පාර නගර සභාව

දමන ප්‍රාදේශීය සභාව

උහන ප්‍රාදේශීය සභාව

මහඔය ප්‍රාදේශීය සභාව

නාමල්ඔය ප්‍රාදේශීය සභාව

පදියතලාව ප්‍රාදේශීය සභාව

නාවිතාන්වෙලි ප්‍රාදේශීය සභාව

සම්මන්තුර ප්‍රාදේශීය සභාව

ඉරක්කාමම් ප්‍රාදේශීය සභාව

අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාව

පොතුවිල් ප්‍රාදේශීය සභාව

අඩ්ඩාලච්චේනෙයි ප්‍රාදේශීය සභාව

ආලයඩිවෙම්බු ප්‍රාදේශීය සභාව

ලාහුගල ප්‍රාදේශීය සභාව

කාර්තිව් ප්‍රාදේශීය සභාව

නින්දවූර් ප්‍රාදේශීය සභාව

තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව.

EOG 03 - 0101

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.